# Living the LOTUS

Buddhism in Everyday Life

1
2020

VOL. 172


Founder's Essay

## බුදුන්ගේ දරුවෙකු බව සිහියේ තබා ගැනීම

අපි නිතරම බුද්ධ ශක්තියට ගෞරව කරමු ලෙස සැහැල්ලුවෙන් පවසනවා. එසේනම්, එම බුද්ධ ශක්තිය නියමාකාරයෙන් ගෞරව කිරීමට හැකිවන්නේ කෙසේද?

ඒ සදහා, 'මම බුදුන්ගේ දරුවෙකි' ලෙස නිතරම තමන්ට පවසා ගනිමින්, හදවතට එය බද්ධ කර ගැනීම වැදගත් වේ. එවිට කම්මැලිකමෙන් ජීවිතය ගත කිරීමට හෝ සුළු දෙයටත් කේන්ති ගැනීමට නොහැකිවේ.

මනෝ විද්‍යා උපදේශකයෙකු මෙසේ පවසා ඇත 'යහපත් දේ ගැන සිතන්නේ නම් යහපත් ප්‍රතිඵල ලැබේ, අයහපත් දේ ගැන සිතන්නේ නම් ඒ හා සමානව අයහපත් ප්‍රතිඵල ලැබේ. ඒ උපවිඥානය විසින් අප සිතන දෙයට අනුකූලව කටයුතු කරන නිසා' බව පැවසේ.

'බාහිර ස්වරූපය පිළිවෙලට තබා ගන්නේ නම්, ඉබේම අභ්‍යන්තරයද පරිණත බවට පත්වේ' ලෙස ස්නායු රෝග ප්‍රතිකර්ම සොයාගත් වෛද්‍ය මසතකේ මොරිතා මහතා පවසා තිබේ. එහි අරුථ සරළව පවසනවා නම්, ඇඳුම් පිළිවෙලට ඇඳීමෙන් ප්‍රතාපවත් බව ඇතිවී, 'අමනා කටයුතු කළ නොහැකියි' යන හදවතට පත් වන බවයි.

'මම බුදුන්ගේ දරුවෙකි' ලෙස නිතරම සිහියේ තබා ගැනීමෙන්, කවුරු මොන දේ පැවසූවත් සිනහා මුසු මුහුණින් 'මේ පුද්ගලයාට ධර්මය අවබෝධ වේවා' මෛත්‍රියෙන් කටයුතු කිරීමට හැකියාව ලැබේ.

*Kaiso Suikan* 9, P. 208-209


Living the Lotus
Vol. 172 (January 2020)

Senior Editor: Koichi Saito
Editor: Kensuke Osada
Copy Editor: P.A.D. Somapala, Ruklanthi Palipana, Sahan Chamara

Living the Lotus is published monthly by
Rissho Kosei-kai International,


Fumon Media Center 3F, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email:
living.the.lotus.rk-international@kosei-kai.or.jp


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජිවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවූ ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවූ සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවූ අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.

*President's Message*

# තම ස්වකීය ආත්මය වෙතට නැවත පැමිණීම



නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

## නව වසර ගත කරන්නේ කෙසේද?

සුභ නව වසරක් වේවා.

නව වසරත් සමඟම උදවන වසන්තයට ගැලපෙන සතාරෝ සතෝ විසින් විසින් රචිත කවියකි මේ,

ඉමක් කොණක් නොපෙනෙන - හැඩක් රුවක් නොදකින
කාලය දිග හැරෙයි මා ඉදිරියේ - අවුරුද්දක් විලසින

නව වසර පිළිගන්නා අප ඉදිරියෙහි සමෘද්ධිමත් හා නැවුම් බවින් යුතු 'කාලය' දිග හැරී තිබේ.

එසේම, මෙම වසර නියම සමෘද්ධිමත් බව උදවන ආකාරයට කටයුතු කළ හැකිවන්නේ, වෙන කෙනෙකුට නොව තමාටම පමණි. එදිනෙදා හමුවන පුද්ගලයන් හා සිදුවීම් සෑම දෙයක්ම තමා, හේතුව හෝ ප්‍රත්‍යයක් බවට පත්වීමෙන් හට ගනී. තව දුරටත් පවසනවා නම්, ඇත ලෝකයේ ඇතිවන සිදුවීම් පවා තමා හා සබඳතාවයක් නොමැති එක් දෙයක් හෝ නොමැතිය. එසේනම්, මේ වසර කුමන ආකාරයේ අවුරුද්දක් බවට පත්කර ගන්නවාද යන්න රැඳී තිබෙන්නේ තමා මතය.

එනම්, අවුද්දක් ගත කරමින් තමාව කුමන් ආකාරයට දියුණු කරගන්නවාද, වර්ධනය කර ගන්නවාද කරුණ ඉතා වැදගත් වේ.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ, 'ආනන්ද තෙරුණ්ට විවරණ දීම' යන නව වන පරිච්ඡේදයේදී, බුදුන් වහන්සේගේ ගිහිකල පුත්‍රයා වන රාහුල තෙරුණ්ට හා ආනන්ද තෙරුණට 'විවරණ දීම' ගැන සදහන් වේ. රාහුල තෙරුණ්ට විවරණ දීමේදී, බුදුන් වහන්සේ විසින් 'ඔහු සතු රහස්‍ය පුහුණුව, මා පමණි දැන හදුනන්නේ' සේ වදාලහ. බුදුදහම පිළිබඳ විද්වතෙකු වන ෆුමියෝ මිසුතනි මහතා වරක් මෙසේ පැවසූහ. රාහුල තෙරුණ් යනු, සැරියුත් තෙරුණ් මෙන් ප්‍රඥවෙන් මුල්තැන ගත් අයෙකු හෝ පුර්ණ තෙරුණ් මෙන් විශිෂ්ට වාක් චාතුර්ය බවකින් යුතු කෙනෙකු නොවේ. නමුත් 'රාහුල තෙරුන්ව ආරක්ෂා කල අයගේ කැපවීම හා රාහුලගේ ධෛර්යය තුලින් රහස්‍ය පුහුණුවේ යෙදෙමින්, ධර්මය ආරක්ෂා කිරීමට සුක්ෂම ආකාරයට පුහුණු වුවෙකි' සේ සදහන් කර ඇත.

සැරියුත් හා පුර්ණ තෙරුණ් මෙන් විශිෂ්ඨ වු ප්‍රාඥවක් හා හැකියාවක් තිබු අයට ගෞරව කරනවා සේම, විශිෂ්ට හැකියාවකින් නොයුතු රාහුල ගැන අවධානය යොමු කරන්නේ මා පමණක් නොවේ යයි සිතමි. අපි, අපගේ දියුණුව හා වර්ධනය ගැන සිතනවා සේම, රාහුල තෙරුණ්ගේ කැපවීම කුමන ආකාරයේ වන්නට ඇතිද.

## නිහතමානීව හා අවංකව

බුද්ධ ශාසනයේ පැවිදි බවින් ජේෂ්ඨ භික්ෂූන්ට වෙහෙර විහාරස්ථාන වල කාමර භාවිතයට මූලිකත්වය දී තිබුණි.

විටෙක බුදුන් වහන්සේ හා රාහුල තෙරුණ් සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ සිටින විට, ජේෂ්ඨ භික්ෂූන් වහන්සේ පිරිසක්ද වැඩම කලහ. එවිට රාහුල තෙරුණ් තමා සිටි කාමරය එම ජේෂ්ට භික්ෂූන් වහන්සේට ලබා දුන්නා. එයින් රාහුල තෙරුණට සැපත් වීමට ස්ථානයක් නොතිබුණ නිසා, බුදුන් වහන්සේ වැඩසිටි කුටිය ඉදිරිපස විවේක ගත්හ.

තවත් විටෙක, රාහුල තෙරුණ් වහන්සේ යනු බුදුන් වහන්සේගේ ගිහිකල පුත්‍රයා බව දැනගත් පිරිස්, උන් වහන්සේගේ පාත්‍රයට වැලි දැමූ අවස්ථා හා පහර දුන් අවස්ථාවන්ද තිබේ. ඒ හැම විටකම රාහුල තෙරුණ් වහන්සේ සියළු දෙයම විඳදරා ගත්හ.

'රහස්‍ය පුහුණුවේ අග්‍රස්ථානය' රාහුල තෙරුණ්ට ලැබුණු ගෞරව නාමයයි. ඒ ආකාරයට රාහුල තෙරුණ්ට පත්වීමට හැකිවුවේ, සැරියුත් තෙරුණ් වහන්සේ ඇතුළු ජේෂ්ඨ භික්ෂූන් වහන්සේලාගේ උපදෙස් හා අනුශාසනා අවංකව සවන් දෙමින්, අන්‍යයන් බලාගෙන නොසිටන විට පවා නිහතමානීව ධර්මය ඉගෙන ගෙන ප්‍රායෝගිකව පුහුණු කල නිසා යැයි සිතමි. බුදුන් වහන්සේගේ ජේෂ්ඨ පුත්‍රයා ලෙස ඉපිද, ශාක්‍ය නුවරදී, තම පියා වූ බුදුන් වහන්සේගෙන් 'දායාද' ඉල්ලා, මහණ වූ තැන පටන් විනීතභාවයෙන් යුතුව නිතරම 'අවංක වෙමු', 'නිහතමානී වෙමු' ලෙස හදවතට ධාරණය කරගෙන නිහඬව අධ්‍යාත්මික දියුණුව ඇතිකර ගැනීමට දැරූ 'රහස්‍ය පුහුණුව' රාහුල තෙරුණ්ගේ කැපවීම වේ.

ඒ තුල මුල්‍යමය වාසි හෝ තත්වය උසස් කර ගැනීමේ බලාපොරොත්තු හෝ බුදුන් වහන්සේගේ දරුවෙකු ලෙස උඩඟු බවද නැත. නිතරම සිදු කලාවූ 'රහස්‍ය පුහුණුව' තුලින් සෑම මනුෂ්‍යයෙකු තුලම තිබෙන බුද්ධ ශක්තිය අවබෝධ කරගෙන, රාග, දෝෂ, මෝහයෙන් ඈත් වී 'තම ස්වකීය ආත්මය' ට නැවත පැමිණියා වේ.

ඒ ආකාරයට සෑම පුද්ගලයෙකුටම තම ස්වකීය ආත්මයට නැවත යාමට හැකියාව තිබේ. එබැවින් අප එකිනෙකා අවංකව හා නිහතමානී බව අමතක නොකර එදිනෙදා ජීවිතය උපරිම කැපවීමෙන් ගත කිරීම තුලින්, දීප්තිමත්ව හා සංසුන් වසරක් බවට මේ වසර පත්කර ගනිමු.

From *Kosei*, January 2020

# මනුෂ්‍යයන්ගේ හදවතේ හඬට සවන් යොමුකරමින්

චෙන් ෂුෆෙන් මිය
රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය, තයිනාන් ශාඛාව

*මෙම සෙප්පෝව 2019/11/09 වන දින නික්යෝ නිවනෝ තුමාගේ ජන්ම දින සැමරුම් උත්සවයේදී තයිනාන් ශාඛාවේ පැවැත්වූ සෙප්පෝවකි.*

නික්යෝ නිවනෝ තුමාගේ ජන්ම දින සැමරුම් උත්සවය පවත්වන සුභ දවසක සෙප්පෝවක් කිරීමට ලැබීම හදවතින්ම ස්තූතිවන්ත වනවා.

මම 2007 වර්ෂයේදී කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වුන නමුත්, මාව සංවිධානයට හඳුන්වා දුන් තැනැත්තිය ටික කලෙකින් සංවිධානයෙන් ඉවත් වුනා. ඇය ඉවත්වීමට හරි ආකාර හේතුවක් නොදන්නවා වුවත්, මම සාමාජිකත්වය ගෙන ටික දිනකින්, ඇය සමඟ ජපාන මුලස්ථානයේ ධර්ම මන්දිරය වැඳ පුද ගැනීමට ගියා. එහිදී ඇය, අපි නවාතැන් ගත් ස්ථානයේදී මම ජපන් මුදලින් යෙන් 1000 ක මුදලක් සොරාගත්තා යැයි කෑගසන්නට වුනා. සමහරවිට ඇය සංවිධානයෙන් ඉවත්වීමට එය හේතුවක් වෙන්න ඇති. මම සංවිධානයෙන් ඉවත්වුවහොත්, මම සොරාගත්තා යන සැකය ඇතිවන නිසා ඉවත් නොවී සිටීමට කටයුතු කලා. ඉන් වසර කිහිපයකට පසුද, එයට සමාන සිද්ධියක් ඇතිවුනා. ඒ අවස්ථාවේදිත් හැමෝම මාව සැක කලා වුනත්, ඇත්ත කවදා හෝ එළිවේවි යැයි සිතා කෝසෙයි කායි සංවිධානයෙන් ඉවත් නොවී කටයුතු කළා.

ඒ අතර කෝසෙයි කායි සංවිධානයේ ඉගැන්වීම් හොඳින් ඉගෙන ගැනීමට සිතා ගත්තා. මට අපැහැදිලි වූ සමහර කරුණු අනෙක් සාමාජිකයන්ගෙන් විමසුවත්, එයට පිළිතුරුක් දීමට කෙනෙක් සිටියේ නැත. ඒ නිසා, 'සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර යේ අටුවාව' කියවමින් ස්වයං උත්සහයෙන්



නොවැම්බර් 09 වන දින තයිනාන් ශාඛාවේදී
සෙප්පෝව පවත්වන චෙන් මිය

ඉගෙන ගත්තා. ඒ තුලින්, මට සිදු වූ දේවල් ධර්මය සමඟ සම්බන්ධ කිරීමට උත්සහ කලත්, නියමාකරයෙන් නොහැකිව, කාලය ගත වී ගියා. ගිය වසරේදී, අළුතින් පත්වූ හිරොසෙ ඉකුයෝ කියොකයිචෝ සාන්ගෙන්, අගර්හිත බෝධිසත්වයන් වහන්සේගේ බුද්ධ ශක්තියට ගෞරව කිරීම හා 'සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර යේ අටුවාවේ' අන්තර්ගතය පැහැදිළිව ඉගෙන ගත්තා. ඒ තුලින් පෙරට වඩා ධර්මය වටහා ගැනීමට හැකි වුන නමුත්, තවමත් සෑහීමකට පත් විය නොහැකි තැන් කිහිපයක්ද සිත තුල තිබෙනවා.

ඉන් ටික කලකට පසු හෝසා නායකයෙකු ලෙස පත්විය. ඉනුත් මාස 6 කට පසු ගිය වසරේ 10 වන මස ධර්මාචාර්ය ලබා ගැනීමට අවස්ථාව උදාවිය. ධර්මාචාර්ය ලබා ගැනීමට පෙර තිබෙන ශාඛා පුහුණුව සඳහා තයිතෝ ධර්ම ශාඛාවට ගියා. එහිදී හෝසා නායකයෙකුගේ වගකීම් හා රාජකාරි හරියාකාරව වටහා ගැනීමටද, තවද අන් අයව තෙදොරි කිරීමේ වැදගත්කමද වටහා ගැනීමට හැකිවුවා.

ධර්මාචාර්ය ප්‍රධානෝත්සවයේ පැවැත්වූ ඔදයිමොකු සජ්ජායන පුහුණුවේදී, යුද්ධයේදී මිය ගිය සියාගේ රුව මතකයට නැගී, කඳුළු වැගිරෙන්නට විය. සීයා ගැඹුරු මුහුදු පතුලේ කූඩුවක් වැනි ස්ථානයක සිරවී සිටිනවා වාගේ පෙනුනා. ඉන් පසු පැවැත්වූ හෝසාවේදී අන්තර්ජාතික මූලස්ථානයේ ප්‍රධානී, සයිතෝ මහතාගෙන් මේ ගැන උපදෙස් පැතූ විට 'ධර්මාචාර්ය තනතුර ලබාගෙන, හෝසා නායකයෙකු ලෙස තමාගේ හදවතේ පරාසයට එහා ගොස් කටයුතු කිරීම වැදගත් යැයි සිතනවා' කියා උපදේශයක් ලැබුනා. එම උපදේශය ඉතා කෘතවේදී බවක් දැනුන නිසා, අළුත් ජීවයක් ලැබුනා යන හැඟීමෙන්, මව් රටට නැවත ගොස් තවත් හොඳින් ධර්මය පුරුදු පුහුණු කිරීමට අධිෂ්ඨාන කරගත්තා.

සීයා යුද්ධ කාලයේ දී, ජපන් හමුදාවට බැඳී සිට මිය ගොස් තිබුණි. නමුත් කවදා කොතනදී මරණයට පත්වුනා දැයි නොදනී. නැවත මම මාගේ රටට යාමට පෙර, යුධ සමයේ මියගිය අයගේ නම් සදහන් කර තිබෙන යසුකුනි නම් ශින්තෝ විහාරයට ගොස් සීයා ගැන අසා ඒ ගැන සෙව්වත්, සියාගේ තොරතුරු වල මදිකම නිසා කිසි දෙයක් දැන ගැනීමට බැරිවිය. එසේ වුනත් ශින්තෝ විහාරයේ දුරකථන අංකය ලියාගෙන තායිවානයට ගියා.

පෙර සිටම සීයාගේ සහ මුතුන් මිත්තන්ගේ කයිමියෝ (මිය ගිය අයට පින් අනුමෝදන් කිරීමට දෙන විශේෂ නාමය) ලබාගන්න යැයි උපදෙස් ලැබුන නමුත්, ඒ සඳහා අයදුම් කිරීමට හැකිවුනේ නැහැ. ජපානයේ සිට තායිවානය පැමිණි පසු හිරොසේ ක්යෝකයිචෝ සාන්ට මුතුන් මිත්තන්ට පින් අනුමෝදන් කිරීම සඳහා කයිමියෝ ලබා ගැනීමට වුවමනායි සේ පැවසූවත්, ක්යෝකයිචෝ සාන් විසින් 'ඔයා දැන් ධර්මාචාර්ය ලබාගෙන නේ සිටින්නේ, ඒ නිසා ඔයාම පිළියෙල කරන්න' යැයි උපදෙස් ලැබුනා. ක්යෝකයිචෝ සාන්ගෙන් කයිමියෝවක් සාදන ආකාරය ඉගෙන ගන්න ගමන්, ජීවිතයේ පලවෙනි කයිමියෝ එක සියා වෙනුවෙන් පිළියෙල කලා. එදිනම පවුලේ විස්තර ඇතුලත් ලේඛනයක් යසුකුනි ශින්තෝ විහාරයට යැව්වා. ඉන් සති 3කට පසු සීයා කවද, කොතනදී මරණයට පත්වුනාද යන තොරතුරු ඇතුලත් ලියුමක් ආවා. ඇත්තටම පුදුමයට පත්වුනා. නාවික හමුදාවේ සිටි සීයා, අවුරුදු 35දී පිලිපීනය අසල ප්‍රදේශයේදී මරණයට පත් වී ඇතිබව එහි සඳහන් වුනා. කයිමියෝ ලබාගැනීම, සූත්‍ර සජ්ජායනය කිරීමේ වැදගත්කම තේරුම් ගැනීමට එම සිදුවීමෙන් අවස්ථාව ලැබින. ධර්මාචාර්ය ලබාගැනීමේදී ඇයි සීයාව සිහියට නැගුනේද යැයි පුදුමයෙන් ඒ ගැන සිතමින් සිටියා. සියාට කුඩා අවධියේ සිටි මගේ තාත්තාව දලා මැරෙන්න වෙනවා, එයත් කාගෙවත් හවුහරනක් නොමැතිව. යුද්ධයෙන් වසර 70 කට පසුවත් සීයාගේ ආත්මය ගැඹුරු මුහුදු පතුලේ සිරවී සිටිනවා යන්න සිතූ විට, කෙතරම් ඉවසිලිවන්ත පුද්ගලයෙකුද යැයි සිතුනා. සීයාගේ එම විඳදරාගැනීමේ ගුණය, මේ මොහොතේ මගේ ජීවිතයට අත්‍යාවශය දෙයක් බව වටහාගත්තා.

මාව කෝසෙයි කායි සංවිධානයට හඳුන්වා දුන් තැනැත්තිය, මම හොරෙක් ලෙස හංවඩු ගැසූ නිසා, ඇයට කිසිදු සමාව නොදීසිටියා. නමුත් සීයාගේ සිද්ධිය තුලින් මෙය බුදුන් වහන්සේ මට ඉවසීමේ ගුණය ප්‍රගුණ කිරීමට ලබා දුන්නා යැයි සිතා, ඇයට සමාව දීමෙන් මෙතෙක් නොදැනුන හදවතේ සැහැල්ලු හැඟීමකට පත්වුනා. එසේම ධර්මාචාර්ය ලබාගැනීමට ජපානයට යාමට ගුවන්ගත වීමට පෙර, යතුරු පැදිය පදවමින් සිටියදී එක් ස්ථානයකදී අනතුරකට පත් වුනා. එහිදි ලොකු තුවාලයක් සිදුනොවුනත්, එම ස්ථානය මට හොරා ලෙස හංවඩු ගසපු, මාව සංවිධානයට හඳුන්වා දුන් පුද්ගලයා පදිංචිව සිටි ස්ථානයට කිට්ටුවයි. 'ධර්මාචාර්ය ලබාගන්නා මාව මේ ධර්ම මාර්ගයට හඳුන්වා දුන් ඇයව, මම නැවතත් මිච්බිකි කර ධර්ම මාර්ගයට ගැනීම කලයුතු යැයි' සිතුවා. ඉන්පසු කිහිප වතාවක්ම හමුවීමට උත්සාහ කලත්, මම යැයි දුටුවිට දොර අරින්නෙ නැතිව සිටියා. මින් ඉදිරියට කොපමන කාලයක් ගතවේදැයි නොදන්නවා වුනත්, නොනවත්වා උත්සහවන්තව ඇයව නැවතත් ධර්ම මාර්ගයට ගැනීමට කටයුතු කරනවා.

නොවැම්බර් මාසයේ ශිබුචො සාන් සහ සැමියා පිටරට සංචාරයකට ගිය නිසා, සෑම දිනකම ශාඛාවට ගොස්, සූත්‍ර සජ්ජායනය කිරීමට සිදු වුනා.. බොහෝ විට දෝෂි සිදුකරමින්, තුන් වෙළුම් සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය මුලුමනින්ම සජ්ජායනය කිරීමට හැකිවුනා. මුලින්ම එම කටයුත්ත කිරීමට හැකි වේවිදෝ යැයි බියක් තිබුනත්, අවසාන වශයෙන් හොඳින් කිරීමට හැකිවීම නිසා ලෝකු සතුටක් ඇති වුනා. ඒ වාගෙම සෑම දෙනාටම අසීමිත හැකියාවක් තිබෙන බවත්, බුද්ධ ශක්තිය තිබෙන බවත්, බුදුන් වහන්සේට සමාන ප්‍රඥවක් සහ පිං බලයක් ඇති බවත් වටහා ගැනීමට හැකිවුවා. තවදුරටත් එය අන් අයට අවබෝධ කරදී, සත්‍ය වූ සතුට ඇතිකර ගැනීමේ වැදගත්කම වටහාගත්තා.

තවද, ගිය වර්ෂයේ දීර්ඝ කාලයක් ධර්ම ශාඛාව පවත්වා ගෙන යාමට උදව් උපකාර කළ චියු ජී සී සාන් මරණයට පත් වී, තයිනන් ධර්ම ශාඛාවේදී පළමු වතාවට කෝසෙයි කායි සංවිධානයේ ආකාරයට අවසන් කටයුතු සිදුකරනු ලැබුවා. එම අවස්ථාවේදී මට ඇතිවුන හැඟීම තවමත් මතකයේ තිබේ. චියූ මියගෙන්, අපි මිනිසුන් විදියට කොහොමද ජීවිතය ගෙන යන්නේද යැයි ඉගෙන ගත්තා. චියූ මියගේ දේහය ඉදිරියේදී, දුකට පත්ව සිටින අය ලඟට ගොස්, ඔවුන්ට හොඳින් ඇහුන්කන්දී, ඔවුන්ට ධර්මය කියා දීමට අධිෂ්ඨාන කලා.

ගිය වර්ෂයේ 9 වන මස, ධර්මාචාර් ලබා ගැනීමට පෙර ජ්‍යේෂ්ඨ සාමාජිකයෙකු වන L මහතාගේ ලේලියව මිච්බිකි කළා. L මහතා ජපන් භාෂා ප්‍රවීණයෙකි. ජපන් ජාතික කියොකයිචෝ සාන්ලාගේ පරිවර්තන කටයුතු හා පොත් පත් පරිවර්තන කටයුතුද සිදුකරමින්, ධර්ම ශාඛාවට විශාල දයකත්වයක් ලබාදුන් තැනැත්තෙකි. දැන් වයස 94 කි, වසර 6ක පමණ සිට මොළයේ රෝගයකින් පෙළෙමින්, කතා කිරීමට පවා අපහසු තත්වයට පත් ව රෝද පුටුවේ ජීවිතය ගත කරනවා. එසේම වසර 2 කට පෙර සාමාජික මුදල් එකතු කරන හෝසා නායකයා හා L මහතාගේ පුතුන් අතර වැරදී වැටහීමක් ඇතිවී, L මහතා නොදනුවත්වම සංවිධානය අතහැර ගිය සාමාජිකයෙකු ලෙස සලකන තත්වයට පත්වී තිබෙනවා. වචන වලින් පිට නොවුනත් ඉතාමත් ආසාවෙන් කටයුතු කළ කෝසෙයි කායි සංවිධානය සමඟ තිබු සම්බන්ධතාවය නැතිවී යාම ගැන කණගාටුවෙන් පසුවන බවට සැකයක් නැතැයි සිතනවා. L මහතාගේ 2 වන පුතාගේ මිය ගොස් සිටියත්, ඔහුගේ බිරිද සමඟ රැකියාවේ සම්බන්ධතාවයකින් දැන හඳුනාගත්තා. දැන් L මහතාව රැක බලාගන්නේද ඇය තනියමයි. ඇය කෝසෙයි කායි සංවිධානය ගැනද විවිධ මතවාදයන් දරාසිටියා. ඇය හමු වීමට ගිය සෑම විටම ඇයගේ කතාවට හොඳින් ඇහුන්කන් දුන්නා. ඉන් අවුරුද්දකට පසු, මාව විශ්වාස කරන තත්වයට පත්වී කෝසෙයි කායි සංවිධානයේ සාමාජිකත්වය ලබාගත්තා. මම ධර්මාචාර් ලබා ගෙන පැමිණ කෙටි කාලයකින් ඇයගෙ මව මරණයට පත් වුනා. වහාම කයෝසියුන් ප්‍රදේශයට ගොස්, හදවතින්ම සූත්‍ර සජ්ජායනයට කළා. හිරොසෙ කියොකාචෝ සාන්ගෙ මඟ පෙන්වීමෙන්, ඉක්මනින් කයිමියෝවද ලබාගත්තා. ඒවාගේම, ඇයගේ නිවසේදී ආදාහන කටයුතු සඳහා සහභාගී වි සිටි සාමාජිකයන් නොවන පවුලේ අය 20 දෙනෙකු පමණ සිටියදි, කියෝකායිචෝ සාන් සමඟ කොසෙයි කායි සංවිධානයේ සූත්‍ර සජ්ජායනයත් කිරීමට ලැබී, ඉතාමත් සතුටට පත් වුනා.

ඉන් වසරකට පසු මේ වර්ෂයේ 9 වන මස L මහතාගේ දුවව මිච්බිකි කිරීමට හැකියාව ලැබිණා. L මහතාගේ දරුවන් කෝසෙයි කායි සංවිධානයට අකමැතියි යන්න අසා තිබුන නිසා, ඒ නිසා මම අනිවාර්යයෙන්ම ඔවුන්ව මිච්බිකි කරන්න ඕනැ යැයි සිතා ගත්තා. කෝෂෝ මැතිනිය උගන්වන ආකාරයට 'මුලින්ම කරලා බලමු' යන පාඨයට අනුව ඔවුන්ව මිච්බිකි කිරීමට උත්සහ කර බැලුවා. එසේ කළ විට, කෝසෙයි කායි සංවිධානයට අකමැත්තක් නොමැති බවට අවබෝධ විය. L මහතාගේ දියණියගේ මාමන්ඩිය මරණයට පත් වී සිටි නිසා, පින් අනුමෝදන් කිරීම වෙනුවෙන් කොසෙයි කායි හි සාමාජිකත්වය ලබා ගත්තා. ඇයගෙන්, මවගේ පින් අනුමෝදන් කිරීමේ වැඩසටහන් වලට L මහතා හා පවුලේ සියළු දෙනා එක් රැස් වී ආහාර ගන්නා බව දැනගත්තා. මව පිළිබඳ ගැඹුරු හැඟීම දෙමාව්පියන්ට සැළකීම ඒ වගේම පවුලේ සහෝදර සහෝදරියන් එකමුතුව සිටීම කෝසෙයි කායි සංවිධානයේ ඉගැන්වීම් නේ දැයි සිතුවා. ඔවුන්ගේ තිබෙන දෙමව්පියන්ට සැළකීම යන බුද්ධ ශක්තියට ගෞරව කරමින් කටයුතු කිරීම වැදගත් බව වටහා ගත්තා.

මෙම වර්ෂයේ 10 වන මස ඔයිෂිකි සඳහා මුලස්ථානයට ගොස්, ධර්ම ශාඛා පුහුණුවට අකිතා ප්‍රදේශයේ ඔදතේ ශාඛාවට ගිය විට, යසුයෝ යමමොතෝ මියව හමු වුනා. ඇයගේ මාමණ්ඩිය කෝයිචි යමමොතෝ වන අතර, ඔහු තායිනාන් ශාඛාවේ නිර්මාතෘ වන සදඔ ඔත්සුකි මහතා සමඟ කිහිප වතාවක්ම තයිනාන් ධර්ම ශාඛාවේ ධර්ම ව්‍යාප්ත කටයුතු සිදු කර ඇත. කෝයිචි මහතා වසර 3 කට පෙර මරණයට පත් වුනත්, මරණාසන්න වීමට පෙර සෘජුව සම්බන්ධතා පවත්වා ගැනීමට නොහැකි වු තායිනාන් සාමාජිකයන් ගැන, විශේෂයෙන් L මහතා ගැන කනස්සල්ලෙන් පසු වුන බව දැන ගත්තා. යසුයෝ මිය තායිනාන් ධර්ම ශාඛාවට ගොස් නොතිබුනත්, මාමණ්ඩිගෙන් කිහිප වතාවක්ම අසා දැන සිටි නිසා තායිනාන් ශාඛාව සමීපතාවක් තිබුණා යැයි පෙනුනා. එසේම මාමණ්ඩියද මරණයට පත් වු පසු L මහතාගේ ලැබු ලියුම් වැනිදේ වැදගත් කොට සලකමින් පරිස්සමින් තබාගෙන සිට අපිට පෙන්නුවා. එම ලියුම් ජපන් භාෂාවෙන් ලියා තිබු ලස්සන එවා විය. කෝයිචි මහතා පසු කාලීනවද බ සාන්ට කිහිප වතාවක්ම ලියුම් යැව්වද, නැවත පිළිතුර ලියුම් පැමිණියේ නැත. එක් දවසක් L මහතාගේ පුතා විසින්, තාත්තා අසනීපයෙන් සිටින නිසා නැවත ලියුම් එවන්න එපා යැයි දුරකථනයෙන් පවසා තිබුනා. එතැන් සිට ඉතාමත් දුකෙන් සිටිමින්, L මහතා තවම ජීවතුන් අතර සිටිනවාද යන්න සිතමින්, තායිනාන් ධර්ම ශාඛාව ගැනද කනස්සල්ලෙන් කෝයිචි මහතා මිය ගිය බව ඇය පැවසුවා. එය තදින්ම මාගේ හදවතට කා වැදුනා. වසර ගණනාවකම තායිනන් ශාඛාව ගැන සිතමින්, තමා මරණයට පත් වුනත්, එම හැඟිම ලේලියට භාර දුන් කෝයිචි මහතා ගැන සිතු විට, මේ වසර 2 තුල බ සාන්ගේ ලේලිය හා L දුවව මිච්බිකි කිරීමට හැකිවුනේ, කෝයිචි මහතාගේ ආත්මය මාව දිරිමත් කල නිසා යැයි සිතා, මෙ ගැන L මහතාගේ දුවට පැවසුවා.

කෝසෙයි කායි සංවිධානයේ විශිෂ්ඨතාවය නම්, සාමාජිකයන්ගේ උණුසුම් හැඟීම්, කරුණාවන්ත බව පිරී ඉතිරී යන තැනක් යැයි සිතනවා. මුළින්ම සහභාගි වුන ඕදතෙ ධර්ම ශාඛාවට වුනත්, මහා ගෙදරට ආවා යන හැඟීම ඇතිවිය. තයිතෝ ධර්ම ශාඛාවේදීත් ඒ ආකාරයටම දැනින. අනෙක් අතට, තායිනන් ධර්ම ශාඛාවේදී තවම ඒ ආකාරයට දැනෙන්නේ නැහැ. නමුත් මට හමුවන සෑම සාමාජිකයෙක් සමඟම එම හැඟීම බෙදාහදාගෙන, එක්ව දුකින් මිදීමට කටයුතු කිරීම වැදගත් බව සිතුවා.

මේ වර්ෂයේ, රිය අනතුරකින් තම එකම පුතාව අහිමි කරගත් අඹුසැමි යුවලක් මිච්බිකි කිරීමට හැකිවුනා. ඉතාමත් දුකකින්, අපරාධකරුට සමාව නොදෙන හැඟීමෙන් ඔවුන්ගේ පුතා නැතිවීමේ දුකට නිතරම ඇහුම්කන් දුන්නා. පුතාගේ කයිම්යෝව ලබාගෙන, පින් අනුමෝදන් කිරීමේ සූත්‍ර සජ්ඣායනයද සිදුකලා වුවත්, තවමත් ධර්මානුකූලව එම සිදුවීමේ තේරුම් ගත හැකි තැනට තවම ඔවුන් පත්වී නැහැ. ගැඹුරු මුහුදු පතුලේ වසර 70 ක පමණ කාලයක් ඉවසිලිවන්තව සිටි සීයා ගැන සිතු විට, එක වසරක් දෙවසරක තෙදොරි කිරීම ප්‍රමාණවත් නැතැයි සිතනවා. මම මිනිසුන්ගේ දුක් කම්කටුළු පැය ගනනක් අසා සිටියද එය කරදරයක් යැයි සිතන්නේ නැහැ. හොඳින් සාවදානව අසා සිට, එම පුද්ගලයා අවබෝධ වන්නා වු ධර්ම කරුණු සමඟ, එක්ව මෙම ධර්ම මාර්ගයේ ගමන් කිරීමට ප්‍රාර්ථනා කරනවා.

මෙවර ඕදතෙ ධර්ම ශාඛා පුහුණුවේදී, වෙනත් ශාඛාවකින් පැමිණි සාමාජිකයෙකු සමග දින 3ක් එකම කාමරයේ සිටියා. පැය කිහිපයක්ම ඇයගේ කතාවට ඇහුන්කන් දුන්නා. ඇය වසර 40 ක පමණ කාලයක් හරිහැටි නින්ද නොයාම යන රෝගයයෙන් පෙළී, නිදිපෙති බොන්නේ නොමැතිව නිද ගැනීමට හැකිවී තිබුනේ නැහැ. ඕදතෙ ධර්ම ශාඛාවේ රාත්‍රියේ පැවති හෝසාවේදී අවුරුදු ගණනක් තිබූ දුක කතා බහ කිරීමෙන් පසු, එදින රාත්‍රියේ සිට නිදිපෙති පානය නොකලත් නින්ද ගොස් තිබුණි. ඇයව සංවිධානයට හඳුන්වාදුන් පුද්ගලයාද කෝසෙයිකායි සංවිධානයෙන් ඉවත්ව ගොස් ඇති නිසා අනාතයෙකු වාගේ හැඟීමෙන් අවුරුදු 12 ක් පමණ සිට ඇත. කෝසෙයිකායි සංවිධානයේ ක්‍රියාකාරකම් වලටද වැඩි සහභාගීත්වයක් නොතිබූ නිසා ධර්මයද එතරම් දැනසිටියේ නැහැ. ඇයද නැවත තම රටට ගොස් හදවතින්ම බෝධිසත්ව චර්යාවන් ප්‍රගුණ කරමින් බෝධිසත්ව මාර්ගයේ ගමන් කරමින් සිටිනවා. ඇත්තටම එය මටද ඉමහත් සතුටක්.

ඊට අමතරව පවුල් ප්‍රශ්ණ නිසා කිසි කෙනෙකුට නොකියන ප්‍රශ්ණ වලින් පෙළී සිටින අය, තව තවත් කෝසෙයි කායි ඉගැන්වීම් කියාදිය යුතු සාමාජිකයන් විශාල ප්‍රමාණයක් සිටිනවා. කෝසෙයි කායි සංවිධානයෙන් ඉවත්වූ සාමාජිකයන්ද විශාල ප්‍රමාණයක් සිටිනවා. මේ ධර්ම මාර්ගයේ නිවරදිව ගමන් කරන විට අනිවාර්යයෙන් සතුට ලැබෙන බව මම විශ්වාස කරනවා. මින් ඉදිරියටද නික්යෝ නිවානෝ තුමාව ආදර්ශයට ගනිමින් නිරන්තරයෙන් සිනාමුසු මුහුණින්, සාමාජිකයන් සමඟ ධර්මය පුරුදු පුහුණු වන බවට දිවුරා පොරොන්දු වනවා.

සියළු දෙනාටම බොහොම ස්තූතියි.

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
## 12 වන පරිච්ඡේදය, දේවදත්ත (පසු කොටස)

### තෘෂ්ණාව හැසිරවීමට ඇති හැකියාව අනුව, යහපත හා අයහපත වෙන් කර ගැනීමට හැකිවේ.

සෑම පුද්ගලයෙකු තුලම තෘෂ්ණාව තිබේ. පැවිදි තැනැත්තන් එම තෘෂ්ණාවෙන් සම්පූර්ණයෙන් මිදීමට උත්සහ දැරිය යුතු වූවත්, සාමාන්‍ය ජීවිත ගත කරන ගිහි පුද්ගලයන්ට එසේ කළ නොහැකිය. එසේ කළ නොහැකි දේ පවා කිරීමට උත්සහ ගැනීම ස්වභාව ධර්මයේ මාර්ගයට විරුද්ධ වීමකි. එහිදී සාමාන්‍ය ජනතාවට වුවද, තෘෂ්ණාව යහපත් ආකාරයට යොදවා ගැනීම ගැන මහායාන ධර්මයේ කියාදෙයි. උදහරණයක් ලෙස, 'සල්ලි හම්බකරන්න ඕනේ' තෘෂ්ණාධික හැඟීමට, 'ලෝකයට වැඩදායි ආකාරය රැකියාව කරමු' යන යහපත් හැඟීම ඇතිකර ගත්විට, රැකියාව කලත්, සල්ලි හම්බකලත්, එය යහපත් ශක්තියක් බවට පත්වේ.

දේවදත්තයන් තෘෂ්ණාව ඒ ආකාරයටම ක්‍රියාවට නැංවීම නිසායි අයහපත් තත්වයට පත්වුවේ. නමුත් මහායාන කියාදීම් වලට අනුකූලව තෘෂ්ණාව යහපත් දිශානතියකට යොමු කරන්නේ නම්, එසැණින් යහපත් දේ කිරීමට හැකිවේ. යහපත් පුද්ගලයන්ගේ හා අයහපත් පුද්ගලයන්ගේ වෙනස එයවේ. එබැවින් දේවදත්තයන්ද ධර්ම පුහුණුව තුලින් තෘෂ්ණාව යහපත් ආකාරයට භාවිතා කරන්නේ නම්, තෘෂ්ණාව තුලින් තෘෂ්ණාව නැතිකර ගැනීමෙන් බුදු බව සාක්ෂාත් කර ගැනීමට හැකිවේ. එම කරුණ මෙම පරිච්ඡේදයේ පෙර කොටසෙන් ඉගෙන ගත හැකි 2 වන කරුණ වේ.

මීළඟට පසු කොටස ගැන සාකච්ඡා කරමු.

සාගර නාග භවනේ නාග දියණියගේ ධර්ම ව්‍යාප්ත කටයුතු කර පැමිණි මංජු ශ්‍රී බෝධිසත්වයන්ගෙන්, 'නාග දියණියට කුමන කරුණු දේශනා කලේද' ලෙස ප්‍රඥකූට බෝධිසත්වයන් වහන්සේ විමසූහ. 'සද්ධර්ම සූත්‍රය පමණයි' සේ පිලිතුරු දුන් සැනින් නැවතත්, 'සාමාන්‍ය ජනයා තුල එම ධර්මයට අනුකූලව බුද්ධත්වය සාක්ෂාත් කරන අය සිටින්නේද' යැයි නැවතත් විමසූහ. එවිට 'සිටිනවා, අවුරුදු 8 ක් වන සාගර නාගරාජයානන්ගේ දියණියයි' සේ මංජු ශ්‍රී බෝධිසත්වයන් පිළිතුරු දුන්හ. එසැණින් සාගර නාගරාජයානන්ගේ දියණිය පැමිණ, බුදුන් වහන්සේට එකත්පස පිහිටා වන්දනා කළහ.

එය බල සිටි ශාරිපුත්‍ර තෙරුණ් වහන්සේ, නාග දියණිය දෙසට හැරී, 'බුදුබව ලබා ගැනීමට ඉතා දීර්ඝ කාලයක් මහත් කැපවීමෙන් ධර්මය පුරුදු පුහුණු කල යුතුය. සය පාරමිතාවන් සම්පූර්ණයෙන්ම පුහුණුවෙන් පසුවයි සම්බුද්ධත්වය සාක්ෂාත් කර ගැනීමට හැකිවන්නේ. කිළිටි බවින් බහුල කාන්තා ශරීරයකින් යුතු ගැහැණු ළමයින්ට කෙසේවත් එයට ළඟා විය නොහැකිය.' සේ පිළිතුරු දුන්හ.

නාග දියණිය එයට පිළිතුරු නොදී, අනර්ඝ මාණික්‍යයක් ගෙන බුදුන් වහන්සේට පූජා කලහ. එය ත්‍රි සහශ්‍ර ලෝක ධාතුර්වට වඩා වටිනාකමින් යුතු මැණිකකි. බුදුන් වහන්සේ එය පිළිගත්හ. එවිට නාග දියණිය, ප්‍රඥකූට බෝධිසත්වයන් හා ශාරිපුත්‍ර තෙරුණ් දෙසට හැරී, 'බුදුන් වහන්සේ මාගේ මාණික්‍ය භාර ගත්තාටත් වඩා වේගයෙන් මා සත්‍යාවබෝධය ලබා ගනිමි' යැයි පවසමින්, එසැණින් මිනිසෙකු බවට පත්ව, බෝධිසත්ව චර්යයාව අංග සම්පූර්ණ කර දක්ෂිණ දිශාවේ නිර්මල නම් බුද්ධ භූමියේ සියළු සත්වයන්ට ධර්මය දේශනා කරන අයුරු දැකගත හැකිවිය.

එම දර්ශනය ඉතා ඕනෑකමින් බලා සිටි ප්‍රඥකූට බෝධිසත්වයන් හා ශාරිපුත්‍ර තෙරුණ් වහන්සේද තවත් බොහෝ පිරිසක්ද ඉතා උද්දමයට පත්ව, එම සිදුවීම තුලින් ඉතා වැදගත් වු සත්‍යයක් හදවතට බද්ධ කර ගැනීමට හැකිවිය.

### කාන්තාවකට වුවද බුදුබව ලබා ගත හැකිය

ඉන්දියාවේ කාන්තාව යනු පිරිමියාට වඩා පහත්, ඉතා අපවිත්‍ර පව් වලින් පිරී සිටින බැවින් දුකින් මුදවීමට හැකියාව නොමැති ලෙස තහවුරු වී තිබුණි.



ඒ ආකාරයේ කාන්තාවන් වුවද, මනුෂ්‍යයෙකු ලෙස ලබා ගත හැකි උත්තරීතර තත්වය වන 'බුදුබව' ලබා ගත හැකි වන නිසා, 'දේවදත්ත පරිච්ඡේදය' නව යුගයක් ආරම්භ කරන ප්‍රකාශයක් හා සමාන විය. ලෝක ඉතිහාසය තුලදී කාන්තා හා පිරිමි සමානාත්මතාව ගැන පැහැදිලිවම ප්‍රකාශ කල පලමු අවස්ථාව මෙයවිය.

කාන්තාවන්ගේ හා පිරිමින්ගේ ස්වරූපය, ඉදිරි පරම්පරාව බිහි කිරීමේ කාර්භාරය, ගුණාංග හා ලක්ෂණ අනුව සහජයෙන්ම නොයෙකුත් වෙනස්කම් ඇත. ස්වරූපයන්ගෙන් ඒ ආකාරයේ වෙනස්කම් ඇති කාන්තාවන් හා පිරිමින්, එකිනෙකාට ආවේණික වූ සහජ ගුණාංගයන් තුලින් සාමකාමී පවුලක් ගොඩනැගීමටත් සාමකාමී සමාජයක් බිහි කිරීම වෙනුවෙනුත් නියම කාන්තා හා පිරිමි සමානාත්මතාව තිබිය යුතු බව අමතක නොකල යුතුය. එය සාදචාරත්මක හා සාමාජීය වශයෙන් තිබෙන කාන්තා හා පිරිමි සමානාත්මතාවය වේ.

එම කරුණු තේරුම්ගෙන තිබුණද, එකල මනුෂ්‍යයන් තුල තිබුණ කාන්තාවන් අවඥවට ලක් කරන හැගීම තුරන් කර ගැනීමට නොහැකිවිය. එහිදී බුදුන් වහන්සේ සිදු කලේ, තවත් ටිකක් ගැඹුරින් දේශනා කිරීමයි. එනම්, සෑම මනුෂ්‍යයෙකුගේම පදනම එක හා සමානයි (සැමටම සත්‍යාවබෝධය ලැබීමට හැකියාව තිබේ) ලෙස විවරණ ලබා දුන්හ. තවත් අයුරකින් පවසනවා නම්, 'කාන්තා හා පිරිමි භේදයකින් තොරව, සෑම මනුෂ්‍යයෙකුගේම පදනම බුද්ධ ශක්තියෙන් යුතුවේ' යන මතවාදය පැහැදිලිවම ප්‍රකාශ කලහ.

දෙගිඩියාවක් ඇති කළ අනෙක් කරුන වන්නේ, නාග දියණිය කාන්තා ස්වරූපයෙන් නොව පිරිමි ස්වරූපයට පත්ව බුදු බව ලබා ගැනීමයි. ඉපැරණි ඉන්දියාවේ මනුෂ්‍යයන්ගේ මානසිකත්වය ගැන කල්පනා කිරීමෙන් එය අවබෝධ කර ගත හැකිය. කාන්තාවක් පිරිමියෙකු ලෙස ස්වරූපය වෙනස් කරගෙන බුදු බව සාක්ෂාත් කර ගැනීම නාට්‍යමය



ස්වරූපයක් වුවද කාන්තාවන් අවඥවට ලක්කරන පිරිසට එය ආකර්ෂණීය බවක් ගෙන ගෙන දෙමින්, තේරුම් ගැනීමට පහසු විය.

## විශ්වාසයේ බලවත්බව

සාරග නාග භවනේ සිට පමිණි අවුරුදු 8 ක් පමණ වන නාග දියණිය සැණකින් බුදු බවට පත්වීම, සැරියුත් තෙරුණ් වහන්සේද විශ්වාස නොකලහ. නමුත් එම කරුණ මේ ආකාරයට ඉගැන්වේ.

අවුරුදු 8 ක දියණියක් යනු 'කුඩා දරුවෙකුගේ සේ අවංක හදවත' සංකේතවත් කරයි, නාග භවන යනු මනුෂ්‍ය වාසයෙන් ඈතට ගිය ස්ථානයන් සංකේතවත් කරයි. ත්‍රී සහශ්‍ර ලෝකයක් වටිනා මාණික්‍ය යනු 'විශ්වාසය' වේ.

කුඩා දරුවෙකු සේ අවංක හදවතින්, බුදුන් වහන්සේ දේශනා කල ධර්මය විශ්වාස කරන්නේ නම් එම මොහොතේම බුදුන් වහන්සේ හා සමඟ එකට බද්ධ වීමට හැකිවේ. මේ මුළු විශ්වයම තමාගේ කර ගත හැකිය. එබැවින් 'විශ්වාසය' ත්‍රී සහශ්‍ර ලෝකයක් හා සමාන වටිනාකමකින් යුතු වේ.

වටිනා මාණික්‍යය බුදුන් වහන්සේ සැණකින් භාරගත්තා යනු, 'විශ්වාසය' තිබේ නම් බුදුන් වහන්සේගේ හදවත හා ක්ෂණිකයෙන් ඍජු බැදීමටක් ඇති කර ගැනීමට හැකි බවයි. එහිදී ඇතිවන හැගීම, බුදු බවට යා කරන කෙටිම මාර්ගය වේ.

සාමාන්‍යයෙන් මනුෂ්‍යයන් ධර්ම කරුණුවල න්‍යායන් මත නොයෙකුත් මවාපෑම් කරයි. ධර්ම න්‍යායන් අනිවාර්යයෙන්ම වැදගත් වුවත්, ඒ මතම එල්බගෙන සිටීමෙන් පමණක්ම ධර්මය අවබෝධ නොවේ. නාග භවනේ සිටි අවුරුදු 8 දියණිය මෙන් සම්පූර්ණ අධ්‍යාපනයක් ලබා නොසිටියා වුවද, පරාර්ථකාමීත්වයෙන් ධර්මය හදපත්ලෙන්ම විශ්වාස කරන්නේ නම්, නියම ධර්මාවබෝධය ලබාගත හැකිවේ.

අපිද ධර්මය ඉගෙන ගැනීමේදී, දැනුම රැස් කර ගැනීම, දැඩි අදහස් තිබීම හා හැගීම් වලට වහල් නොවී සුදු පාට කොලයක් සේ හදවත පාරිශුද්ධත්වයට පත්කරගෙන සෑම දෙයම භාර ගැනීම වැදගත් වේ. එම කරුණ 'දේවදත්ත පරිච්ඡේදයෙන්' හා 'උත්සහය පරිච්ඡේදයෙන්' කියාදෙන බැවින්, එය හොඳින් හදවතට බද්ධ කරගත යුතුය.

මේ මස සිට නික්යෝ නිවානෝ තුමා විසින් රචිත
『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』

කෝසෙයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P126-P132

# Director's Column

## නව වසර ගත කරන්නේ කෙසේද?

සුභ නව වසරක් වේවා.

'වසරේ සැලැස්ම තීරණය වන්නේ නව අවුරුදු දිනයේදී' ලෙස කියමනක් ඇත. නව වසර ඵලදායි කර ගන්නවාද, වැඩකට නැති වසරක් කරගන්නවාද යන්න මත, ආරම්භය ඉතාමත් වැදගත් වේ.

නිචිකෝ නිවානෝ තුමා ජනවාරි මස ධර්ම පණිවුඩයේදී, 'මෙම වසර නියම සමෘද්ධිමත් බව උදවන ආකාරයට කටයුතු කල හැකිවන්නේ, වෙන කෙනෙකුට නොව තමාටම පමණි' ලෙස පෙන්වා දුන්නා. විශේෂ වූ හැකියාවක් නොමැති රාහුල තෙරුණ්, රහස්‍ය ධර්ම පුහුණුව මෙන්ම නිහතමානී හා අවංක බවින් ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගත්තා. ඒ ආකාරයට නිතරම ධර්මය ඉගෙන ගනිමින් ප්‍රායෝගිකව පුහුණුවීමේ වැදගත්කම නිවානෝ තුමා පෙන්වාදුන්නා.

බුද්ධ ශක්තියේ වැදගත්බව වටහාගෙන, රාග දෝෂ මෝහයෙන් ඈත් වී, 'තම ස්වකීය ආත්මය' වෙතට ළඟා වීමට, නිහතමානීබව හා අවංකබව අමතක නොකර, දිනපතා උපරිම කැපවීමෙන්, දීප්තිමත්ව හා සංසුන්ව ගත කරමු.


කෝයිචි සයිතෝ මහතා
ප්‍රධානී, අන්තර්ජාතික මුලස්ථානය, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය





We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212FAX: 1-808-455-4633
Email: info@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1817 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
POBox 33636, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, USA
POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 FAX: 1-650-359-6437
Email: info@rksf.org URL: http://www.rksf.org

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809 Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-262-4437
Email: info@rkina.org URL: http://www.rkina.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692042, San Antonio, TX 78269, USA
TEL: 1-210-561-7991 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 FAX: 1-253-945-0261
Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

Facebook: https://www.facebook.com/rishokosseikaidobrasil
Instagram: https://www.instagram.com/rkkbrasil

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP, CEP 08730-000, Brasil

**在家佛教韓国立正佼成会**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571 FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571 FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633 FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會**
台湾台南市崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478 FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059, West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rumpur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218 Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406 FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL/FAX: 880-31-626575

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh
**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh
**Rissho Kosei-kai Patiya**
China Clinic, Patiya Sadar, Patiya, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni,**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Dhaka**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar, Ramu Shibu**

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960 Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
2F Ikh Mandal building, Khurenbulag bag, Bayan-Undur sum,
Orkhon province, Mongolia

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949 Email: roma@rk-euro.org

**Rissho Kosei-kai of the UK**
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230 FAX: 03-5341-1224 URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**